අපේ අංකය : සං/ප්‍රති/01
චක්‍රලේඛ අංක 73
කුඩා තේවතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර
පැලවත්ත, බත්තරමුල්ල.
2013.01.16

චක්‍රලේඛ අංක : 73

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත.

## තේ නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල වැඩිකිරීම.

තේ නැවත වගාව සහ අළුත් වගාව යටතේ ගෙවනු ලබන සහනාධාර මුදල 2013.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් ආකාරයට වැඩිකරනු ලැබ ඇත.

ඉහත වගාක්‍රම වලට අදාලව 2013.01.01 දින සිට හා ඊට පෙර නිකුත් කරන ලද සියළුම අවසරපත්‍ර සඳහා වැඩිකරන ලද සහනාධාර මුදල අනුව ගෙවීම් සකස් කලයුතුය. එහෙත් 2013.01.01 දිනට පෙර සකස් කර ඇති ගෙවීම් ඒ ආකාරයට ගෙවීම් කලයුතු අතර, 2013.01.01 දින සිට සකස් කරනු ලබන ගෙවීම් සඳහා පමණක් සංශෝධිත සහනාධාර මුදල අනුව ගෙවීම් සකස් කලයුතු බැව් අවධාරණය කරමි.

1. **තේ නැවත වගාව**

කේෂ්ත්‍ර පරීක්ෂණ මගින් ලබාදෙන නිර්දේශ පදනම්ව පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල හැකිය.

(අ) පස සාරවත් කිරීම සහිතව - තේ නැවත වගා කිරීම

i. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව සඳහා දැනට ගෙවනු ලබන සහනාධාර මුදල සියළුම තේ වගා කලාප සඳහා හෙක්ටයාරයකට රුපියල් 350,000/- ක් වන පරිදි වැඩිකර ඇති අතර, එම මුදල පහත දැක්වෙන ආකාරයට ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 90,000 |
| 2. පස සාරවත් කිරීම – I | 35,000 |
| 3. පස සාරවත් කිරීම - II | 140,000 |
| 4. තේ වගා කිරීම | 50,000 |
| 5. වසරක් තුල නඩත්තුව | 35,000 |
| එකතුව | 350,000 |

ii. පස සාරවත් කිරීම සහිතව තේ නැවත වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමානය හෙක්ටයාර් 2 දක්වා වැඩි කෙරේ.

(ආ) පස සාරවත් කිරීමෙන් තොරව - තේ නැවත වගා කිරීම

i පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගා කරනු ලබන ඉඩම් සඳහා පහත සඳහන් පරිදි හෙක්ටයාරකට රුපියල් 260,000/-ක් වනසේ ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 90,000 |
| 2. තේ වගා කිරීම | 135,000 |
| 3. වසරක් තුල නඩත්තුව | 35,000 |
| එකතුව | 260,000 |

ii මෙම අනුග්‍රහය ලබාදෙනුයේ මුළු ඉඩම් අයිතිය හෙක්ටයාර් 01 ක් හෝ ඊට වඩා අඩු කුඩා තේ වතු හිමියන්ට වසරකට උපරිම වශයෙන් හෙක් : 0.2023 ක නැවත වගා කිරීම සඳහා පමණි.

2. <u>තේ අළුත් වගාව</u>

ක්ෂේත්‍ර පරීක්ෂණවල නිර්දේශය පදනම් කරගෙන පහත සඳහන් පරිදි පස සාරවත් කිරීම සහිතව හා පස සාරවත් කිරීමෙන් තොරව තේ අළුත් වගාව යටතේ අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල හැකිය.

පස සාරවත් කිරීම සහිතව හෝ පස සාරවත් කිරීමෙන් තොරව අළුත් වගාව යටතේ එක් ඉඩම් හිමියෙකුට වසරකට අවසරපත්‍ර නිකුත් කරන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.4047(අක්කර 01)කට සීමා කෙරේ.

(අ) පස සාරවත් කිරීම සහිතව - තේ අළුතින් වගා කිරීම

i පස සාරවත් කිරීම සහිතව තේ අළුත් වගාව සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාරයකට රුපියල් 250,000/- ක් වන පරිදි සංශෝධනය කර ඇති අතර, එම මුදල පහත දැක්වෙන පරිදි ගෙවීමට කටයුතු කලයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 70,000 |
| 2. පස සාරවත් කිරීම – I | 25,000 |
| 3. පස සාරවත් කිරීම - II | 100,000 |
| 4. තේ වගා කිරීම | 30,000 |
| 5. වසරක් තුල නඩත්තුව | 25,000 |
| එකතුව | 250,000 |

(ආ) පස සාරවත් කිරීමෙන් තොරව - තේ අළුතින් වගා කිරීම

i. මෙම අවසරපත්‍ර සඳහා ගෙවීම් කිරීමේදී පස සාරවත් කිරීම රහිතව පහත සඳහන් පරිදි හෙක්ටයාරයකට රුපියල් 195,000/- ක් වනසේ ගෙවීමට කටයුතු කළයුතුය.

| වාරිකය | හෙක්ටයාරයකට රුපියල් |
|---|---|
| 1. බිම් සැකසීම | 70,000 |
| 2. තේ වගා කිරීම | 100,000 |
| 3. වසරක් තුල නඩත්තුව | 25,000 |
| එකතුව | 195,000 |

පස සාරවත් කිරීමෙන් තොරව තේ නැවත වගාව හා අළුත් වගාව යටතේ ඇති අනෙකුත් කොන්දේසි චක්‍රලේඛ අංක 69 පරිදි ඒ ආකාරයෙන්ම බලපැවැත්වේ. මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත් සනාථ කළයුතුය. ඔබගේ සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කළයුතු අතර, දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කරන්න.

නොයෙල් පද්මසිරි කාරියවසම්
සභාපති

පිටපත් :

1. සාමාන්‍යාධිකාරි
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සංවර්ධන/ව්‍යාප්ති)
3 සහකාර සාමාන්‍යාධිකාරි (සංවර්ධන/පරිපාලන/සේවා)
4. අභ්‍යන්තර විගණක
5. මුදල් කළමණාකරු
6. කළමණාකරු (සැලසුම් හා නියමුකරණ/ ප්‍රජා සංවර්ධන)
7. සියළුම මාණ්ඩලික නිලධාරීන්
8. සියළුම කාර්යභාර නිලධාරීන්
9. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
10. ගරු සභාපති/ගරු ලේකම් සමස්ත ලංකා සමිති සංවිධානය